# කච්චායනය හා මොග්ගල්‍යායනය

බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි භාෂාංශයේ මහාචාර්ය රාජකීය පණ්ඩිත ගරු කොටනෙළුවේ චන්දජෝති මහා ස්ථවිර පාදයන් වහන්සේ විසිනි.

පාලිව්‍යාකරණය පිළිබඳ ආචාර්ය වංශ රැසෙකි. ඔවුන් අතර එකක් කච්චායන වංශය ද එකක් මොග්ගල්ලාන වංශය ද වෙයි. මෙ දෙකින් කච්චායන වංශය පැරණි ය. අනුරාධපුර රාජධානිසමයෙහි ඇති විය. අනෙක එයට වඩා නවීන ය. පොළොන්නරු රාජධානි සමයෙහි ඇති විය. අනුරාධපුර සමයේ වැඩ විසූ කසයින් හිමියෝ පාලියට වියරණගතක් සැපයීමට සිතූහ. සකුවියරණ ඇදුරන් සකුවට වියරණ තැනූ නිසා පරීක්ෂා කොට කාතන්ත්‍රය අනුව ව්‍යාකරණ ග්‍රන්ථයක් සම්පාදනය කළහ. එහෙත් එම පොත නිමාවට ඉගැනීම කරන තුරු පදයෙක නිරාකුලාවබෝධය නොවන තැනට පැමිණ පැවැත්තේ ය. සූත්‍රපාඨක්‍රමය අනුවැ යන හෙයිනි. නාම ශබ්දයන් වරනහාගෙන ඒ ඒ එක එක විභත්තියට අයිති පදරූපයන් සිද්ධ වන පිළිවෙළ එක තැන යොද නොතිබිණ. එහෙයින් ඊට පසු කලෙක විසූ බුද්ධප්පිය හිමියෝ ඒ අඩුව සකස් කරමින් නාම ශබ්ද ටික අකාරන්තාදි වශයෙනුත් පුල්ලිංග, ඉත්ථි ලිඞ්ග, නපුංසකලිංග වශයෙනුත් වෙන් කළහ. තදනන්තර කොට සබ්බනාම සද්ද ගණය යෙදූහ. මේ නයින් පිළිවෙළට එක එක ශබ්දයට අයිති විභත්තිරූප ටික සිද්ධ කරන පිළිවෙළ සැදූහ. එවිට කච්චායනයේ සූත්‍රවල ස්ථාන වෙනස් කරන්ට ද සිදුවි ය. කච්චායනය සංක්ෂිප්ත කර ඉගැන්වීමට අදහස් කළ ධම්මකිත්ති හිමියෝ කච්චායනයට ලුහුඬු සටහනක් තැනූහ. එම ලුහුඬු සටහන බාලාවතාරය නම් විය. පසු කලෙක බොහෝ පරිවාර ග්‍රන්ථයන් සැපැයී ඇත්තේ බාලාවතාරය ගැනයි. එයින් පැහැදිලි වන්නේ වැඩි වැඩියෙන් භාවිතයට පැමිණියේ ඒ පොත බව යි. මහාරූපසිද්ධියත් කච්චායනයත් මොග්ගල්ලානයත් ග්‍රහණධාරණ වශයෙන් පරිහරණය කිරීම අපහසු වූ නිසා බාලාවතාරයට වැඩි සැලකිල්ල හිමි විය. මහා ග්‍රන්ථයන්ගේ පරිහරණය අඩු වී කුඩා ග්‍රන්ථයේ පරිහරණය වැඩි විය. එහෙත් අතින් අත ලියා ගැනීමෙන් මහා ග්‍රන්ථයන්ගේ ආරක්ෂාව සලසා තැබීමට පූර්වාචාර්යවරු අමතක නොකළහ. පාලිව්‍යාකරණය පිළිබඳ විශේෂඥනය අපේක්ෂා කරන විද්වතුන් විසින් මෙකලදී පවා බොහෝ උත්සාහ දරමින්. දිග කලක් ගෙවමින් එම මහා ග්‍රන්ථයෝ ද හදරනු ලබති. එම ග්‍රන්ථයන් හදරන විමසන විද්වතුන්ට තමන් අපේක්ෂා කරන ව්‍යාකරණ ඥනය ලැබෙන අතර ම එම ග්‍රන්ථ දෙක පිළිබඳ කතුවරුන් (එනම්: කච්චායන - මොග්ගල්ලාන ආචාර්යවරුන්) අන්‍යොන්‍ය විරුද්ධකාරයන් වශයෙන් විසූ බව පෙනී යන කරුණෙකි. කච්චායන හිමියෝ කාටවත් විරුද්ධ නොවූහ. ස්වකීය ශක්තියේ තරමින් ව්‍යාකරණ ග්‍රන්ථයක් නිපැයූහ. දෙස් ද නොකීහ. විරුද්ධ වූවෝ මුගලන් හිමියෝය. දෙස් කීවෝ ද මුගලන් හිමියන්ගේ පාක්ෂිකයෝය. ඒ දෙස් කියූ කාලයේ කච්චායන හිමියෝ ජීවතුන් අතර පවා නොසිටියෝ ය. මොග්ගල්ලාන හිමියන්ට කච්චායනයේ අඩු තැන් සහ නොමනා තැන් පෙනිණි නම් එම හිමියන්ගේ සාධාරණ ක්‍රියාව විය යුතු ව පැවැත්තේ බුඩප්පිය හිමියන් මහා රූපසිද්ධිය කළා සේ අඩු

තැන් පිරවීමත් නො සකස් තැන් සැකසීමත් ය. එතෙකුදුවුව උන් වහන්සේ කළේ කච්චායනය සමාජයෙන් ඉවත් කරවන ක්‍රියාමාර්ගයෙකි. ඇත්ත වශයෙන් මොග්ගල්ලානය කච්චායනය මෙන් සුබෝධව තිබුණේ නම්, සිදුවන්ට තිබුණේත් ඒ ටික ම ය. මොග්ගල්ලානය දුර්බෝධ වූ නිසා කච්චායනයට තවත් කල් පවතින්ට ඉඩ සැලසී තිබේ. මොග්ගල්ලාන හිමියෝ ද කච්චායන හිමියන් මෙන් සංස්කෘතය අනුගමනය කළහ. තදනුසාරයෙන් මොග්ගල්ලාන ව්‍යාකරණය සම්පාදනය කළහ. එය සුඛග්‍රාහ්‍යාකාරයෙන් සම්පාදනය නොකළහ. සුඛග්‍රාහ්‍යත්වය එහි නොවූ නිසාම එය ග්‍රහණ ධාරණය අතින් ඈත් විය. කච්චායනයට වඩා මොග්ගල්ලානය පිරිපුන් බවත් ශාස්ත්‍රානුකූල බවත් උගත්තු පිළිගනිති. එහෙත් සිය සිසුනට එය හැදෑරවීමට නොපෙලඹෙති විශේෂඥතාපේක්ෂක කිහිපදෙනෙක් කලාතුරකින් මොග්ගල්ලානය හදරති: හදරවති ඒ මිස කච්චායනය ඉවත ලා මොග්ගල්ලානයෙනම පාළියේ ව්‍යාකරණඥානය සම්පූර්ණ කරගන්ට සිතන්නෝ, යෙදෙන්නෝ නැත. මුගලන් හිමියන් ජීවත් වූ කාලයේ ඇතැම් විට එබන්දන් සිටියහයි සිතිය හැකියි. දැන් නම් මොග්ගල්ලානයට ම වෙසෙසින් ගැති වූ වෝ නැත.

කච්චායනයත් මොග්ගල්ලානයත් සංසන්දනය කර බලන්නෝ ඒ දෙපොතින් නා නා විධ විශේෂතාවන් දකිති. කච්චායන - මොග්ගල්ලාන මතභේද වශයෙන් ඒවා හඳුන්වති. ඒ දෙපොත අතර පෙනෙන වෙනස්කම්වලින් රාශියක ස්වරූප නිරූපනය කිරීම මේ ලිපිය සැපයීමේ අදහස වෙයි.

මෙසේයි:

කච්චායන හිමියන් සූත්‍ර කීපයෙකින් සිදුකළ කාර්‍ය්‍යයන් මොග්ගල්ලාන හිමියෝ එකම සූත්‍රයෙකින් සිදු කළහ. උදාහරණ:-

දීඝං-පූර්වස්වරය ලොප් කළ විට පරස්වරය දීර්ඝ වේ. (ක. 15 වෙනි සූත්‍රය)

පුබ්බොච - පූර්වස්වරය ද දීර්ඝ වේ. (ක. 16 සූත්‍රය)

දීඝං - ව්‍යඤ්ජනය පර කල්හි පූර්වස්වරය දීර්ඝ වේ. (ක. 25)

රස්සං - ව්‍යඤ්ජනය පර කල්හි ඇතැම් තැනෙක ස්වරයෝ හ්‍රස්ව වෙති. (ක. 26 සූත්‍රය)

මේ සූත්‍ර සතරම වෙනුවට මොග්ගල්ලාන හිමියෝ එක් සූත්‍රයක් සැපයූහ. 'බ්‍යඤ්ජනෙදීඝරස්සා' යනුයි. (මො. 33 සූ)

ඇතැම් තැනෙක කච්චායන හිමියන් එක් සූත්‍රයෙකින් සිදු කළ කාර්‍ය්‍යය සිදු කිරීම පිණිස මොග්ගල්ලාන හිමියෝ සූත්‍ර දෙකක් රචනා කළහ. සියලු යො විභක්තිවලට සහ නී ආදේශවලට 'ආ, ඒ,' ආදේශ කිරීමට ''සබ්බයොනීනමාඑ'' (ක. 107) කියා එක් සූත්‍රයක් එයි. ඒ සඳහා මොග්ගල්ලාන හිමියෝ සූත්‍ර දෙකක් රචනා කළහ. 'අතොයොනං ටා ටෙ' (මො. 1-43) නීනංවා (මො. 1-44) කියායි.

මෙබඳු තැන් ඒ පොතින් තවත් දක්ක හැකියි.

මොග්ගල්ලාන හිමියෝ කච්චායනයේ එන සමහර සූත්‍රයන් දෙස බලා ඒවා ස්වරූපයෙන් වෙනස් කළහ.

උදාහරණ: -

පූර්වස්වරලෝපය,

කච්චායනයේ 'සරා සරෙ ලොපං' (12 වෙනි සූත්‍රය)

මොග්ගල්ලානයේ, 'සරො ලො පො සරෙ' (26 සූත්‍රය)

පරස්වර ලෝපය,

ක, 'වා පරො අසරූපා' (13 සූත්‍රය)

මො, 'පරො ක්වචි' (27 සූත්‍රය)

අසවර්ණ දේශය,

ක, 'ක්වචාසවණ්ණං ලුත්තේ' (14 සූත්‍රය)

මො, 'යුවණ්ණානමෙඔලුත්තා' (29 සූත්‍රය)

යවාදේශය.

ක, 'ඉවණ්ණොයං නවා-වමොදුදන්-තානං' (21,18 සූත්‍රය)

මො, 'යවා සරෙ' (30 සූත්‍රය)

යවාදේශ 2.

ක, 'යමෙදන්තස්සාදෙසො (17) වමොදුදන්තානං' (12)

මො, 'එ ඔනං' (31)

වර්ගාක්ෂරද්විත්වය.

ක, 'වග්ගෙ ඝොසා ඝොසානං තතිය පඨමා' (29)

මො, 'චතුත්ථ දුතියෙස්වෙසං තතිය පඨමා' (35)

සාමාන්‍යද්විත්වය.

ක, 'පරද්වෙ භාවො ඨානෙ' (28)

මො, 'සරම්හා ද්වෙ' (31)

වර්ගාන්තාදේශය,

ක, 'වග්ගන්තං වා වග්ගෙ' (31)

මො, 'වග්ගෙ වග්ගන්තො' (41)

කච්චායනයෙහි එන සමහර සූත්‍රයන් ස්වරූපය වෙනස් නොකරම මොග්ගල්ලාන හිමියෝ ස්වකීයග්‍රන්ථයෙහි යොදගත්හ.

උදහරණ:-

'කාලද්ධානමච්චන්ත සංයොගෙ' (ක. 300, මො. 2-3)

'යොනමානො' (ක 190 මො 2-158)

'පරොක්ඛෙ අ උ එ ත්ථ අ ම්හ ත්ථ රෙ ත්ථො ව්හො ඉ ම්හෙ' (ක. 428, මො. 6-6)

'භාවකම්මේසුතබ්බානීයා' (ක. 542. මො. 5 – 27)

'සුනංහිසුච' (ක. 89. මො. 2 – 91)

'නිග්ගහීතඤ්ච' (ක. 37. මො. 138)

මොග්ගල්ලාන හිමියෝ අමුතු පරිභාෂා සූත්‍ර රාශියක් නිපදවූහ.

උදහරණ:-

'විධිබ්බිසෙසනන්තස්ස' (මො. 1-13)

'සත්තමියං' (මො. 1 – 14)

'පඤ්චමියං පරස්ස' (මො. 1 – 15)

'ආදිස්ස' (මො. 1 - 16)

'ඡට්ඨියන්තස්ස' (මො. 1 – 17)

'ඩනුබන්ධො' (මො. 1 - 18)

'වනුබන්ධො නෙකවණ්ණො සබ්බස්ස මො.' 1 – 19)

'ඞකානුබන්ධාද්‍යන්තා' (මො. 1-20)

'මනුබන්ධො සරානමන්තා පරො' (මො. 1 – 21)

'විප්පටි සෙ ධෙ' (මො. 1 – 22)

'සංකෙතො නවයවොනුබන්ධො' (මො 1 – 23)

'වණ්ණ පරෙන සවණ්ණො' (මො. 1 – 24)

මේ ආදියයි.

කච්චායනයේ ද මොග්ගල්ලානයේ ද එන සංඥා සූත්‍රවල සම විෂමතා.

| | | |
|---|---|---|
| අක්ෂර | අක්ඛරාපාදයො එක චත්තාළීසං | (ක 2) |
| | අ ආදයො තිතාළීස වණ්ණා | (මො 1) |
| ස්වර | තත්‍රොදන්තා සරා අට්ඨ | (ක. 3) |
| | දසාදෙ සරා | (මො. 2) |
| හ්‍රස්ව | ලහුමත්තා තයො රස්සා | (ක. 4) |
| | පුබ්බො රස්සො | (මො. 4) |
| සවර්ණ | ——————— | |
| | ද්වෙ ද්වෙ සවණ්ණා | (මො. 3) |

| | | |
|---|---|---|
| දීර්ඝ | අඤ්ඤෙ දීඝා | (ක. 5) |
| | පරො දීඝො | (මො. 5) |
| බ්‍යඤ්ජන | සෙසා බ්‍යඤ්ජනා | (ක. 6) |
| | කාදයො බ්‍යඤ්ජනා | (මො. 6) |
| වර්ගාක්ෂර | වග්ගා පඤ්චපඤ්චසො මන්තා | (ක. 7) |
| | පඤ්චපඤ්චකා වග්ගා | (මො. 7) |
| නිග්ගහීතය | අං ඉති නිග්ගහීතං | (ක. 8) |
| | බින්දු නිග්ගහීතං | (මො. 8) |
| ඣලසඤ්ඤා | ඉවණ්ණුවණ්ණා ජ්ඣලා | (ක. 58) |
| | ඉවණ්ණුවණ්ණා ජ්ඣලා නාමස්සන්තෙ | (මො. 9) |
| පසඤ්ඤාව | තෙ ඉත්ථිඛ්‍යාපො | (ක. 59) |
| | පිත්ථියං | (මො. 10) |
| ඝසඤ්ඤාව | ආඝො | (ක. 60) |
| | ඝා | (මො. 11) |
| ගසඤ්ඤාව | ආලපනෙ සි ගසඤ්ඤො | (ක. 57) |
| | ගොස්‍යාලපනෙ | (මො. 12) |

වීරිත සන්‍ය කර්තෘහු විසින් එම සන්‍යයෙහි ලා ප්‍රකාශ කළ මත භේද කීපයක්ද මෙතැන් සිට දැක්වේ.

1. කාත්‍යායන වර්ණමාලාව අකුරු එක්සාලිසෙකින් සමන්විතය. මොග්ගල්ලාන හිමියෝ තව ද වර්ණ දෙකක් එකතු කර, වර්ණ තෙසාලිසක් පැහ එකතු කර ඇත්තේ 'ඒ, ඕ' යන හ්‍රස්ව පණකුරු දෙකයි.
(වි. ස. 4 වෙනි පිට)

2. කච්චායනයෙහි 'බුසම්ව' යන්න, මොග්ගල්ලානයෙහි 'භූසාමිව' කියා එයි. කච්චායනයෙහිදී එය විසන්ධි කරන්නේ 'බුසා+එව' කියායි. එහි, එකාර ඉකාර වෙයි. මකාරයෙක් එකතු වෙයි. පූර්වය හ්‍රස්ව වෙයි. 'බුසම්ව' යනු සෑදෙයි. මොග්ගල්ලානයෙහි විසන්ධිය 'භූසා + ඉව' යනුයි. 'ඉ' කාරාශ්‍රයෙහි 'මි' ආගමය පමණක් සන්ධි කාර්ය වශයෙන් යෙදෙයි. 'භූසාමිව' යනු සිද්ධවෙයි.
(වි. ස. 20 වෙනි පිට)

3. දීර්ඝ කිරීමත් හ්‍රස්වකිරීමත් පිණිස බ්‍යඤ්ජනෙදීඝරස්සා' (1-33) කියා මොග්ගල්ලාන හිමියෝ එක්ම සූත්‍රයක් පෙන්නුම් කරමින් එම කාර්යය පිණිස කච්චායන හිමියන් සූත්‍ර සත රක් ඉදිරිපත් කිරීම වැඩි වැඩෙකැයි යෙති.
(වි. ස. 21 වෙනි පිට)

4. 'අතිප්පගො ඛො' යන්න 'අතිප්ප+ඛො'යි විසන්ධි කොට සිද්ධ කිරීම කච්චායනයෙහි ඉගැන්වෙයි. මොග්ගල්ලාන හිමියන් පිළිගන්නේ 'අතිප්පගො' යන්න ප්‍රථමා විභක්ත්‍යන්ත එක්ම ශබ්දයක් වශයෙනි. එයට 'ඛො' යන නිපාතය ළං කළ විට 'අතිප්පගො ඛො' කියා සිටින බව උන්වහන්සේ දක්වති. 'අතිප්පගො' යන්න විභක්ති ගැනීමට පෙර අතිප්පග ශබ්දය බව උන්වහන්සේගේ පිළිගැනීමයි. ඒ මතය අනුව 'ඔ' කාර 'ග' කාරයන් ආගමන කිරීම අනාවශ්‍යක බව පෙනෙයි.
(වි. ස. 25 වෙනි පිට)

. පාතාවාර අර්ථයන්හි දී ආධාරාර්ථයෙහි දුතියා විභත්තිය යෙදෙන බව කච්චායන මතයෙහි කියන අතර, එම දුතියා විභත්තිය කර්මාර්ථයෙහිම බව මොග්ගල්ලාන හිමියෝ පවසති.
(වි. ස. 43 වෙනි පිට)

6. ''සචෙ මං නාලපිස්සති' යන්නෙහි එන්නේ 'සහාර්ථ තතියා විෂයෙහි

දුතියා විභත්තිය'' යනු කච්චායන මතයි. එය කර්ම විෂයෙහිම දුතියාව බව මොග්ගල්ලාන මත යි.

(වි. ස 43 වෙනි පිට)

7. 'අක්ඛෙ දිබ්බති' යන්නෙහි 'අක්ඛෙ' යන්න 'කරණාර්ථයෙහි දුතියා' යනු කච්චායන මත යි. එය 'කර්මාර්ථ යෙහිම දුතියා' බව මොග්ගල්ලාන මත යි.

(වි. ස. 43 වෙනි පිට)

8. කච්චායනයේදී ඉත්ථම්භූතාර්ථයෙහි දක් වූ තතියාව මොග්ගල්ලානයෙහිදී ලක්ෂණාර්ථයට ගෙන තිබේ.

(වි. ස. 59 වෙනි පිට)

9. රොචනාර්ථ ධාතුයෝගයෙහි චතුත්ථී විභත්තිය යෙදෙන බව කච්චායන හිමියන් කියතත් මොග්ගල්ලාන හිමියන් කියන්නේ රොචනාර්ථධාතු යෙදෙන හැම තැනම චතුත්ථීවිභත්ති නොයෙදෙන බවයි.

(වි. ස. 63 වෙනි පිට)

10. කච්චායන හිමියන් සිලාඝාදි සූත්‍රයෙන් (ක 279) චතුර්ථී විභත්තිය නියම කරන හැම තැනටම මොග්ගල්ලාන හිමියන් නියම කරන්නේ ෂට්ඨී විභක්තියයි.

(වි. ස. 64 වෙනි පිට)

11. ආයු භද්‍රාර්ථ කුශලාර්ථ යෝගයෙහි ද හිතසුඛාර්ථ යෝගයෙහි ද ආසිංසනයක් ගම්‍යමාන කල්හි ද චතුර්ථී කිරීම කච්චායන මතය යි. එම අර්ථයන්හි ෂට්ඨීවිභත්තිය යෙදීම මොග්ගල්ලාන හිමියන්ට අභිමත යි.

(වි. ස. 68 වෙනි පිට)

12. සම්මුතිප්‍රයෝගයෙහි චතුර්ථී විභත්තිය යෙදීම කච්චායනමතයි. ෂට්ඨී කිරීම මොග්ගල්ලාන මත යි.

(වි. ස. 69 වෙනි පිට)

13. සප්තම්‍යර්ථයෙහි ද ආවිකරණ පාතු-භවනාදියෝගයෙහි ද එාසු ආදි නාමයෝගයෙහි ද සිලාඝාදි සූත්‍රයෙහි ව ග්‍රහණයෙන් චතුර්ථී විභක්තිය නිය මිතයි. මෙකී හැම තැන්වලම ෂට්ඨී විභක්තිය යෙදීම මොග්ගල්ලාන හිමියන් ගේ රුචිය වෙයි.

(වි. ස. 69 වෙනි පිට)

14. 'නමොයොග, හිත සුඛ ශබ්දයෝග, ස්වාගතයෝග' යන තැන්වල චතුත්ථී යෙදීම කච්චායනය කිය යි. එම යෝගයන්හි ෂට්ඨී යෙදීම මුගලන් හිමියෝ කියති.

(වි. ස. 70 වෙනි පිට)

15. කච්චායනයෙහි අපාදන පඤ්චමිය, මොග්ගල්ලාන මතය අනුව අවධි පඤ්චමිය වෙයි.

(වි. ස. 71 වෙනි පිට)

16. 'අජ්ඣේනා පරාජෙති' යනාදියෙහි එන්නේ 'අපාදන පඤ්චමී' බව කච්චායන මතය වන අතර 'අවධි පඤ්චමී' යනු මොග්ගල්ලාන මතය වෙයි.

(වි. ස. 73 වෙනි පිට)

17. 'යවෙහි ගාවො රක්ඛන්ති' යනාදි-යෙහි ද කච්චායනයෙහි අපාදන පඤ්චමිය බව කියන අතර මොග්-ගල්ලානය කියන්නේ අවධිපඤ්චමිය බවයි.

(වි. ස. 73 වෙනි පිට)

15 'උපජ්ඣායා අන්තරධායති සිස්සො' යනාදියෙහි ද අපාදන පඤ්චමී විභත්තිය යෙදෙන බව කච්චායන හිමියෝ කියති. ඒ තැන්වල යෙදෙන්නේ අවධිපඤ්චමී විභත්තිය බව මුගලන් හිමියෝ පවසති.

(වි. ස. 74 වෙනි පිට)

19. 'අධම්මා ජිගුච්ඡති' 'අධම්මා පමජ්ජති' යන තැන්වල ද කසයින් හිමියන් අපාදන පඤ්චමී පවසන අතර මුගලන් හිමියෝ අවධිපඤ්චමිය නියම කරති.

(වි. ස. 75 වෙනි පිට)

20. ''ධාතුයෝගයෙහි පඤ්චමිය වශයෙන් කච්චායනයේ හඳුන්වා තිබෙන්නේ ද 'අවධිපඤ්චමිය වේ'' යනු මුගලන් හිමියන් පවසන පරිදියි.

(වි. ස. 75 වෙනි පිට)

21. දූරන්තිකාදි සූත්‍රය යටතේ කච්චායනයේ අපාදන පඤ්චමී නියම කළ හැම තැනකම වන්නේ අවධි පඤ්චමිය බව මොග්ගල්ලාන ව්‍යාකරණයේ ඉගැන්වීමයි.

(වි. ස. 75 වෙනි පිට)

22 'සුද්ධප්පමොචන විවිත්ත පමාණයොග පභුතියොග' යන තැන්වල පඤ්චමී සහ ප්‍රමාණාර්ථයෙහි තතියා වන බවත් කච්චායනයෙන් පෙනෙයි. ඒ තැන්වල ස්වවිෂයෙහිම ඒ ඒ විභත්තිහු යෙදෙතියි මුගලන් හිමියෝ ස්වමතය දක්වති.

(වි. ස. 78 වෙනි පිට)

23. 'කාලසත්තමී' වශයෙන් කච්චායන හිමියන් හඳුන්වාලූ තැන් මුගලන් හිමියෝ 'විසයසත්තමී' වශයෙන් හඳුන්වා දෙති.

(වි. ස. 83 වෙනි පිට)

24. ස්වාම්‍යාදියෝගයෙහි ලා කච්චායන හිමියන් දක් වූ කරුණු මුගලන් හිමියෝ ස්වවිෂයෙහිලා හඳුන්වති.

(වි. ස. 84 වෙනි පිට)

25. 'සඛි, සඛී' යන ආමන්ත්‍රණ පද සිද්ධ කිරීම ගැනත් මතභේදයක් පෙනෙයි. 'ග' හට 'ඉ ඊ' ආදේශ කොට නිපද වීමට කච්චායනය කියයි. 'නදදිතො' යන්නෙන් 'ඊ' කාර ප්‍රත්‍යය යෙදීම මොග්ගල්ලානයෙන් කෙරෙයි. ඒ අනුව තැනෙක හ්‍රස්ව කිරීමද අවශ්‍ය වනු ඇත.

(වි. ස. 101 වෙනි පිට)

26. ගො ශබ්දයේ රූපවලට ගොණ ආදේශ කොට ගැනීම කච්චායන මතය යි. 'ගොණ' යන්න වෙනම පශුවාචක ශබ්ද ප්‍රකෘතියෙකැයි මොග්ගල්ලාන හිමියෝ එම ආදේශය වළක්වති.

(වි. ස. 105 වෙනි පිට)

27. කච්චායනයේ නො පෙනෙන අමුතු ශබ්දයක් 'ත්‍ය' ශබ්දය වශයෙන් මුගලන් හිමියෝ සබ්බනාම ශබ්ද ගණයට ඇතුළත් කර දක්වූහ.

(වි. ස. 114 වෙනි පිට)

## කච්චායනය හා මොග්ගල්ලායනය අතර සංඥාභිධානයන්ගේ ඇති වෙනස්කම්

| | කච්චායනය | | මොග්ගල්ලායනය |
|---|---|---|---|
| 1. | සන්ධි | — | = |
| | නාම | — | ස්‍යාද්‍යන්ත |
| | සමාස | — | එකත්ථ |
| | තද්ධිත | — | ණාදී |
| | ආඛ්‍යාත | — | ත්‍යාදිය |
| | කිතක | — | තබ්බාදී |

2. (ක) අව්‍යය = අසංඛ්‍ය (මො)

(ක) උපසග්ග = පාදී (මො) (ක) නිපාත = චාදී (මො)

3. (ක) ආඛ්‍යාත – ත්‍යාදිය (මො)

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
|---|---|---|---|---|---|---|---|---|
| ක = | වත්තමාන | භවිස්සති | අජ්ජතනී | හීයත්තනී | පරොක්ඛා | පංචමී | සත්තමී | කාලාතිපත්ති |
| මො = | ,, | ,, | භූත | අනජ්ජතන | ,, | හෙතුඵල | පත්ථනාවිධි | අතිපත්ති |

මොග්ගල්ලානයෙහි ධාතුව හඳුන්වා ඇත්තේ ක්‍රියත්ථ යන නමිනි.